// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2147/36 – 2019 ඔක්තෝබර් 29 වැනි අඟහරුවාදා – 2019.10.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම්, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, බියගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 281 - වල්ගම බටහිර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, වල්ගම ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙළ කරන ලද අංක GA/BIY/ 2019/090 හා 2019.04.23 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත ඉඩම් කොටස් දෙක (02)ට මායිම්:

01. **කැබලි අක්ෂර 'A' – අළුවින්නෙ කුඹුර සහ කිඩඉස්මත්ත – ප්‍රමාණය: හෙක්. 1.6596ක් පමණ**

උතුරට: බියගම ආයෝජන කලාප පරිශ්‍රය; නැගෙනහිරට: බියගම ආයෝජන කලාප පරිශ්‍රය සහ මාර්ගය; දකුණට සහ බටහිරට: මාර්ගය සහ බියගම ආයෝජන කලාප පරිශ්‍රය.

02. **කැබලි අක්ෂර 'B' – ඉඩමේ නම සොයාගත නොහැක – ප්‍රමාණය: හෙක්. 0.0301ක් පමණ**

උතුරට: කැබලි අක්ෂර A සහ බියගම ආයෝජන කලාප පරිශ්‍රය; නැගෙනහිරට: මාර්ගය සහ හිමිකම් කියන අය සොයාගත නොහැකි වගුරු බිම; දකුණට: හිමිකම් කියන අය සොයාගත නොහැකි වගුරු බිම; බටහිරට: මාර්ගය සහ කැබලි අක්ෂර A.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/9/2018/BOI/414.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: බිය/3/1/1/510/ඉඅ.
2019 සැප්තැම්බර් මස 23 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

11 - 983